# දොම්පෙ ප්‍රාදේශීය සභාව

# ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 14 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජනවාරි 11 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව දොම්පෙ ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට දොම්පෙ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අළුතින් ඉදිකර තිබූ සාප්පු සංකීර්ණය හා කාර්යාල ගොඩනැගිල්ලේ පිරිවැය වූ රු.65,553,774 ක් හා උපදේශක ගාස්තු සහ වෙනත් සවිකිරීම් සඳහා වැයකර තිබූ රු.1,415,184 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) නව කාර්යාල ගොඩනැගිල්ලට දුරකථන පද්ධතියක් හා ලීබඩු ලබා ගැනීම සඳහා වැයකර තිබූ රු.1,950,101 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) අවස්ථා දෙකකදී මිලදී ගෙන තිබූ රු.2,282,514 ක්වූ ලීබඩුවල වටිනාකම වෙනත් උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2007 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ අංක RV 8822 දරන ට්‍රැක්ටර් ට්‍රේලරයේ වටිනාකම ඇස්තමේන්තු කර සමාලෝචිත වර්ෂයේදීද ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) රු.19,205,071 ක් වු ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය තුළ කර්මාන්ත 08 ට අදාළව නිරවුල් කර තිබු තැන්පත් රු.3,038,490 ක් ඇතුළත්වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද ගමනැගුම ව්‍යාපෘති 07 ක් සඳහා දොම්පෙ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලැබිය යුතු රු.5,933,458 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(උ) මෝටර් රථ හා කරත්ත ගිණුම් රු.1,128,324 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 <u>**නොසැසඳූ පාලන ගිණුම්**</u>

ගිණුම් විෂයයන් 05 කට අදාලව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.104,274,443 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.106,104,070 ක් විය.

1.3.3 **ගෙවිය යුතු ගිණුම්**

-----------------------

සමාලෝචිත වර්ෂයේ රු.60,349,090 ක් වු ණයහිමි ශේෂයෙන් වසර 01 සිට වසර 04 දක්වා පැරණි ණයහිමි රු.24,026,840 ක් නිරවුල් කර නොතිබුණි.

1.3.4 **සේවක ණය**

----------------

දීර්ඝ කාලයක සිට අයවීම් හිඟ හිටි ණය ශේෂවල එකතුව රු.118,846 ක් විය.

2. <u>**මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**</u>

2.1 <u>**මූල්‍ය ප්‍රතිඵල**</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 22,020,900 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 29,053,903 ක් විය.

2.2 <u>**අභ්‍යන්තර විගණනය**</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. <u>**පද්ධති හා පාලන**</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) කොන්ත්‍රාත් පාලනය

(ඈ) තොග පාලනය